කොළඹ නගර සභා මැතිවරණය

කොළඹ පුරවරය විසිඑක් වැනි සියවසට ගැලපෙන විදියට සංවර්ධනය කරනවා

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ පුරපති අපේක්ෂක

මිලින්ද මොරගොඩ

කොළඹ මහ නගර සභා මැතිවරණයේ සන්ධාන නියෝජනය ගැන හිටපු අමාත්‍ය හා පුරපති අපේක්ෂක මිලින්ද මොරගොඩ මහතා දැක්වූ අදහස් මෙසේ ගොනුවිය.

ප්‍රශ්නය:- එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ පුරපති අපේක්ෂකත්වය කියන්නේ සෑහෙන අභියෝගයක් ඇයි මේ අභියෝගය භාරගත්තෙ?

පිළිතුර:- ජනාධිපතිතුමාගෙ ඉල්ලීමට ගරු කරන්නයි මම මේ තීරණය ගත්තෙ. මේ ගැන නොයෙක් දෙනා නොයෙක් දේ කියල තිබුණා. එතුමා මට මේ යෝජනාව කරන කොට මම එතුමාටත් රජයටත් වෙනත් ආකාරයකින් උදව් වෙමින් හිටිය. මේක එක අතකින් අභියෝගයක් කියන්නත් පුළුවනි. ඒ වගේම අවස්ථාවක් කියන්නත් පුළුවනි. මම හැමදාම අභියෝග දිහා බැලුවෙ අවස්ථා හැටියටයි.

ප්‍රශ්නය:- ඔබට ලැබුණු මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්න හදන්නෙ කොහොමද?

පිළිතුර:- කොළඹ නගරය රටේ හදවත වගෙයි. ඒ නිසා කොළඹ පුරවරය 21 වැනි සියවසට ගැලපෙන හැටියට සංවර්ධනය කරන්නයි මම සැලසුම් කරන්නෙ. හැම ජාතියක්ම ආගමක්ම නියෝජනය කරන සහෝදර ජනතාවක් කොළඹ ඉන්නව. මේ නගරය ජනවාර්ගික සාමයට දිය හැකි හොඳම ආදර්ශයයි. ලක්ෂ 6 1/2ක ජනගහනයක් ඉන්න කොළඹ නගරය ලස්සන කරන අතර කොළඹ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්නයි මම අපේක්ෂා කරන්නෙ.

ප්‍රශ්නය:- ඔබ මේ පුරපති අපේක්ෂකත්වය භාර ගන්න කොට වාසි අවාසි ගැන තක්සේරුවක් කළාද?

රන්ජිත් ආනන්ද ජයසිංහ

පිළිතුර:- ජයග්‍රහණය ගැන බලාපොරොත්තුවක් නැත්නම් එන්නෙ නැහැනේ. ඒ වගේම ජනාධිපතිතුමාගෙ විශ්වාසයක් තිබෙනව එතුමගෙ දර්ශනයට කොළඹ නගරයේ පිළිගැනීමක් තිබෙන බවට. සන්ධාන ජ්‍යෂ්ඨයන් වන සුසිල් ප්‍රේමජයන්ත ඒ. එච්.එම්. ෆවුසි බැසිල් රාජපක්ෂ නිමල් සිරිපාල මෛත්‍රීපාල සිරිසේන, අනුර යාපා වැනි ඇමැතිවරුන් තවත් බොහෝ මැති ඇමැතිවරුන් පිරිසකුත් මට ආශිර්වාද කළා. ඒ කාගෙත් ශක්තිය ලබාගෙන කොළඹ ජයගන්නයි මම සූදානම් වෙන්නෙ. ජනාධිපතිතුමා රට එකතු කරන්න හදන මොහොතක නගරය එකතු කරන්න උදව් වෙන්නයි මම ඡන්දයට ආවෙ. එතුමා නිතරම කියන්නේ තමන් රටටම ජනාධිපති බවයි. සිංහල සමාජය වගේම මුස්ලිම් ජනතාවත් දෙමළ ජනතාවත් තමන්ගේ ඥාතීන් මිතුරන් බව එතුමා නිතරම කියනව.

ප්‍රශ්නය:- සමහරුන්ගේ මතය කොළඹ එක්සත් ජාතික පක්ෂයේ කඳවුරක් කියල නේද?

පිළිතුර:- මේක කාගෙවත් කඳවුරක් නොවෙයි. ජාතික සමගියේ කේන්ද්‍රස්ථානයයි. අනික මේ කඳවුරු බිඳ වැටෙන කාලයක්. අප දේශපාලන පක්ෂවල පාක්ෂිකයන් හැටියට වගේම වගකිව යුතු පුරවැසියන් හැටියටත් කොළඹ සංවර්ධනයට කැපවිය යුතුයි.

ප්‍රශ්නය:- ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා පසුගියකාලෙ අගනුවරට අලුත් සංවර්ධන වැඩ පිළිවෙලක් පටන් ගත්ත. ඒකෙ අනාගතයට මොකද වෙන්නෙ?

පිළිතුර:- ගෝඨාභය රාජපක්ෂ මහත්මය ඉතා හොඳ වැඩ පිළිවෙළක් ගෙනියනව ජනාධිපතිතුමාගෙ මඟ පෙන්වීමෙන්. ඒක ඉදිරියට ගෙනයන්න තමයි අපත් උදව් වෙන්න හදන්නෙ. නමුත් පැල්පත්වලින් මුඩුක්කුවලින් ජනතාව එළවන්න හදනව, දුප්පත් අයගෙ ආර්ථික අවස්ථා නැති කරනව වගේ බොරු ප්‍රචාර රාශියක් දැන් පැතිරෙනව. මෙ කතා සේරම වැරදියි. අපත් රජයත් හදන්නේ කොළඹ සමාජයේ දරුවන්ට කාන්තාවන්ට වැඩිහිටි සමාජයට සැපවත් ජීවිතයක් ගත කරන්න උදව් දෙන්නයි. නගරයක් කියන්නෙ කොන්ක්‍රීට් ඉදිකිරීම නොවෙයි. උණුසුම් හදවත් තිබෙන සමාජයක් කේන්ද්‍රගතවී සිටින තැනක්. අපි ඒ බව දැනගෙනයි මේ ඡන්ද සටන කරන්නේ.

ප්‍රශ්නය:- සමහරු කියනව නගරයේ සංවර්ධනය ආරක්ෂක අංශවලට භාරදීල ජනතාව මත බලෙන් සංවර්ධනය පටවනවය කියල මේ චෝදනාව ගැන ඔබ හොයා බැලුවද?

පිළිතුර:- ඕන පරිවර්තන කාලෙක ඔවැනි අදහස් උදහස් මතුවෙනව. නමුත් රටේ වගේම නගරයේ බහුතර ජනතාවත් පිළිගන්නව සිද්ධවෙන දේ හොඳ දෙයක් කියල. පාරවල් හදල ඇළවල් කාණු ශුද්ධ කරල වෙලාවට කුනු ටික ඇදල ගංවතුර වළක්වන්න වැඩ කරල බේරේ වැව ලස්සන කරල තිබෙනව. ඉතින් මේව නරකද?

ප්‍රශ්නය:- හමුදාව යොදවල නාගරික සංවර්ධණය මිලිටරිකරණය කරලලු?

පිළිතුර:- දැන් යුද්ධය ඉවරයි. ලක්ෂ ගණනක් හමුදා සෙබළු නිකම් කඳවුරුවල තියාගන්නෙ නැතුව. ඒ අය ජාතික සේවයට කැඳවීම වැරදිද රජයේ වියදමත් එයින් අඩුවෙනව. යුද්ධය ආරම්භ වෙන්න කලින් ඈත අතීතයෙන් හමුදාව සංවර්ධන කටයුතුවලට යොදාගත්ත. ඒ අයත් අපේ සමාජයේම සාමාජිකයො. හමුදාව රට බේරගන්න හොඳ නම සංවර්ධනයට නරක ඇයි?

ප්‍රශ්නය:- ඔබ මේ ටික දිනට කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ පවත්නා වහා විසඳිය යුතු ප්‍රශ්න හැටියට හඳුනා ගන්නෙ මොනවාද?

පිළිතුර:- නගර සභා දේශපාලනය පාර්ලිමේන්තු දේශපාලනයට වඩා වෙනස්. ජනතා අපේක්ෂකයන් වෙනස්. නගර සභාව ජනතාවට ඉතාම සමීපයි. මුලින්ම ජනතා ප්‍රශ්න විසඳීමටට දින 100ක සංවර්ධන වැඩසටහනක් සැලසුම් කරල තිබෙනව. වහා විසඳිය යුතු ප්‍රශ්න විසඳන්න. සමාජ සේවාවක් හැටියට පක්ෂ පාට ජාති කුල ආගම් භේදවලින් තොරව දිළිඳුම සමාජයට ප්‍රමුඛත්වය දෙමින් අනෙක් සමාජ කොටස්වලටත් නගර සභාවෙ දොරටු විවෘත කරනව. නාගරික මන්ත්‍රිකම නැත්නම් නගරාධිපතිකම ජීවනෝපායක් නොවෙයි. සමාජ සේවයක් හැටියට කිරීමයි මගේ අරමුණ.

ප්‍රශ්නය:- දේශපාලනඥයන් සාමාන්‍යයෙන් කරන්නෙ පවතින ජනතා ප්‍රශ්න හිඟන්නන්ගේ තුවාලයක් බවට පත් කරන්නෙ ඒ ප්‍රශ්න වටා කැරකෙමින් තමන්ගෙ බලය රැක ගැනීමයි. මේ ක්‍රමය වෙනස් කරන්න පුළුවන්ද?

පිළිතුර:- විවිධ චෝදනා තිබෙනව. ඒත් මම කිව යුතුයි අප සැබෑ ජනතා ප්‍රශ්න හඳුනාගෙන තිබෙන බව කුණු හා කැළිකසළ ඉවත්කිරීම දිළිඳු ජනතාවගේ නිවාස ප්‍රශ්නය නාගරික මාර්ග සංවර්ධන ප්‍රධාන ප්‍රශ්නයි. ඒ ඒ ප්‍රදේශවලට බලපාන ගැටලුත් බොහොමයි. මට්ටක්කුලිය පැත්තෙ ජනතාවගේ ප්‍රධාන ප්‍රශ්නෙ අප ද්‍රව්‍ය බැහැර කිරීමට අවශ්‍ය පොම්පාගාර ඉදිකර ගැනීම. බ්‍රිතාන්‍ය යුගයේ සිට වෙනස් නොවුන ඒ වගේ බොහෝ අංශ වෙනස් කරන්න වෙනව.

ප්‍රශ්නය:- මේ වැඩ කරන්න නගර සභාවට සල්ලි තිබෙනවද?

පිළිතුර:- කොළඹ මහ නගර සභාව පුංචි ආණ්ඩුවක්. ආදායම මදිනම් ඒව හොයා ගන්න ක්‍රම තිබෙනව. දැනටමත් මේ සංවර්ධන කටයුතු සඳහා ලෝක බැංකුව ඇමෙරිකානු ඩොලර් මිලියන 220ක් පසුගියදා දුන්න. අපේ ආරක්ෂක ලේකම් තුමා මහන්සිවෙලයි ඒක ලබාගත්තෙ. ඉදිරිකාලෙදි මේ වගේ තවත් ජාත්‍යන්තර ආයතන හත අටකින් ආධාර ගන්න මමත් සැලසුම්කරල තිබෙනව. ඒ මගින් ඩොලර් ලක්ෂ ගණනක් ලබාගන්න හැකියාව ලැබෙනව. ඒ වගේම විදේශ රටවල ආයෝජකයො කොළඹට ගේන්න සැලසුමක් තිබෙනව. එතකොට නගරයෙ ජනතාවට රැකී රක්ෂා වැඩි වෙනව. ආදායම් මාර්ග වැඩි වෙනව. ජන ජීවිතය උසස් වෙනව. ලෝකෙ බොහොම ජාත්‍යන්තර මූල්‍ය ආයතන රජයකට ආධාර දෙනවට වඩා නගර සභා මට්ටමට මුදල් ආධාර දෙන්න ඉතාම කැමතියි. මට ඒක ලබාගන්නත් පුළුවනි. ඒ ආකාරයට ලෝක ආධාර ලබාගෙන ජනතාවට එහි ප්‍රතිලාභය දෙන බවට ප්‍රතිඥාවක් දෙන්නත් පුළුවනි.

ප්‍රශ්නය:- නාගරික තරුණ සමාජය කාන්තාවන් හා දරුවන්ට ඔබේ සංවර්ධන වැඩ සටහනේ හිමිවන තැන කුමක්ද?

පිළිතුර:- නාගරික තරුණ සමාජය කාන්තාවන් දරුවන් වගේම අන්ත දිළිඳු ජන කොටසක් මගේ මුල්ම ඉලක්කයයි. මේ සියලු දෙනාට සහන ලැබෙන "පුරසවිය" කියල විශේෂ සංවර්ධන වැඩ සටහනක් අප සැලසුම්කරල තිබෙනව. තරුණ සමාජය මත් ද්‍රව්‍යවලින් බේරා ගන්න අපි වැඩ සටහනක් කරන්න යනව. විශේෂයෙන් මෙහිදී ක්‍රීඩාව ඉහළින්ම උපයෝගි කරගන්න පුළුවනි. කොළඹ බල ප්‍රදේශයේ පාපන්දු ක්‍රීඩාංගණ ක්‍රීඩා සමාජ රාශියක් තිබෙනව. ඒව මගින් වෘත්තීය ක්‍රීඩකයන් බිහි කරන්න පුළුවනි. මාසික දීමනාවක් ලබන ක්‍රීඩකයන් නිර්මාණය කරන්න පුළුවනි. "පුරසවියෙන්" දිළිඳුම පිරිසට ආර්ථික ශක්තියක් ලබාදෙන්නත් කටයුතු කරනව. මේ කටයුතුවලට ලංකාවෙ තියෙන කීර්තිමත් පෞද්ගලික සමාගම් පවා ආධාර කරන බවට මට දැනටමත් ප්‍රතිඥා දීල තිබෙනව.

ප්‍රශ්නය:- ඔබ මේ කරන ප්‍රකාශයන්ගෙන් පෙනෙන්නෙ මෙතෙක් කල් පැවැති නගර සභා කොළඹට තමන්ගේ යුතුකම් ඉටුකර නැති බවයි.

පිළිතුර:- මම හිටපු පාලකයන්ට දොස් කියන්නෙ නැහැ. කාලයක් රටේ යුද්දෙත් තිබුණා. ඒ නිසා ප්‍රශ්න ඇතිවුණා. නමුත් දැන් බලන්න කොටුව පිටකොටුව මාළු කඩේ පැත්ත නිදහස් චතුරශ්‍රය, ග්‍රෙගරි පාර, බොරැල්ල රේස්කෝස් පැත්ත, බේරේ පැත්ත, කොච්චර ලස්සනට සංවර්ධනය වෙනවද? මේ වැඩ කටයුතු මෙතැන් සිට තවත් ලස්සනට ඉදිරියට ගෙනියන්නයි අප ජනතාවගෙන් වරමක් ඉල්ලන්නෙ. විශේෂයෙන් උතුරු කොළඹට හා මැද කොළඹට හා බොරැල්ලට මේ සංවර්ධනයේ ප්‍රතිලාභ වැඩිපුර ලැබිය යුතුයි. අපි ඒ ගැන දැනටමත් අධ්‍යයනය කර හමාරයි.

ප්‍රශ්නය:- ඔබ මුලින් සඳහන් කළ "පුරසවිය" වැඩ සටහන යටතේ කොළඹට කරන්නට යන සේවාව කවර ආකාරද?

පිළිතුර:- නාගරික සමාජයට පොදු සේවා සපයන්න සැකසූ විධිමත් සැලැස්මක් ඒක. පොඩි උදාහරණයක් කීවොත් කොළඹ නගරය තුළ ඉතා සුළු මුදලක් ගෙවා ගමන් කළ හැකි බස් සේවාවක් ආරම්භ කරනවා. ඒ වගේ ඉතා අඩු වියදමකින් පොදු මහජන අවශ්‍යතා සපුරා දෙන ක්‍රමයක් ඒක. මෙහි විස්තර අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් වෙනවා.

ප්‍රශ්නය:- ඔබේ දේශපාලන ගමන් මග දෙස බලන කොට ඔබ ඉහළ සමාජය සමග ගනුදෙනු කළ කෙනෙක්. නගර සභාවේදී එහෙම කරන්න අමාරුයි. ජනතාවට වඩාත් සමීප වී මේ විශේෂ ක්‍රමවේදයක් තිබෙනවාද?

පිළිතුර:- පුරවැසියා කියන්නෙ නගර සභාවෙ පාරිභෝගිකයා. අපි ඒ අය තුළ විශ්වාසයක් ඇති කරන්න ඕන කරන වැඩ ගැන. මම සූදානම් නිතරම ජනතාව මුණ ගැහෙන්න. ප්‍රශ්න හඳුනා ගෙන ඒව විසඳන්න. අපට ඉතාමත් හොඳ ශක්තිමත් අපේක්ෂක කණ්ඩායමක් ඉන්නව. ජනාධිපතිතුමා සියලු දෙනා එකතු කරල ඉතාමත් හොඳ අපේක්ෂක පිරිසක් මේ තරගයට දැම්ම. මේ කවුරුත් ජනහද ගැහෙන හැටි දන්න අය. ජනතාව ගෙවන වරිපනම් බද්දට වටිනාකමක් එන සේවයක් දෙන්න මමත් මගේ කණ්ඩායමත් සූදානම්. ජනතාවගේ ප්‍රශ්නවලට නිතර සවන් දෙන්න දුක් ගන්නා රාළ කෙනෙක් පවා පත් කරන්න අපේ අරමුණක් තිබෙනව.

ප්‍රශ්නය:- කොළඹ සිටින බහුතර ජනතාව මුස්ලිම් හා දෙමළ පිරිසයි. ඒ අයට තිබෙන ප්‍රශ්න විශේෂයි. මේවා විසඳීමට ක්‍රමයක් සැලසුමක් තිබේද?

පිළිතුර:- මුස්ලිම් දෙමළ අයගේ ආර්ථික ප්‍රශ්න අපි අධ්‍යයනය කළා. ඒ වගේම ආරක්ෂක ප්‍රශ්න ගැන මම ආරක්ෂක ලේකම් තුමා සමග අදහස් හුවමාරු කරගෙන තිබෙනව. කාගෙත් ප්‍රශ්න අප විසඳිය යුතුයි. ඉදිරි අයවැයේදී නාගරික සමාජයේ ආර්ථික ප්‍රශ්න විසඳෙන ක්‍රමවේදයක් එන බව මට විශ්වාසයි. ඒකට මම රජය උනන්දු කරවනවා. මෙ ගැන මූලික යෝජනා භාණ්ඩාගාර ලේකම් තුමා සමග දැනටමත් සාකච්ඡා කරමින් සිටිනවා.

ප්‍රශ්නය:- මෙම මැතිවරණ සටනේදී සන්ධාන ජ්‍යෂ්ඨයන්ගෙන් ඔබට නියමිත සහය ලැබෙන බවට විශ්වාසද?

පිළිතුර:- අපොයි ඔව්. මම නිතරම ජ්‍යෂ්ඨයන්ට ගරු කරන ඒ අයගෙ උපදෙස් පිළිපදින කෙනෙක්. ආණ්ඩුවෙ ප්‍රධානියා ලෙස ජනාධිපතිතුමන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා හවුල්කාර පක්ෂවල ප්‍රධානීනුත් මට උදව් දෙනව. බොහෝ ජ්‍යෂ්ඨ මැති ඇමැතිවරු ළඟටම ගිහිල්ල මම උදව් ඉල්ලුවා. මම ඉතාම නිහතමානීව කාගෙත් සහයෝගය ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය:- මෙවර ඔබ සමග තරගයට ඉදිරිපත් කෙරෙන ලැයිස්තුව ගැන ඔබ සෑහීමට පත්වනවද?

පිළිතුර:- ඔව් ඉතාමත්ම ප්‍රබල ලැයිස්තුවක් අපේ ලැයිස්තුව. හැම ජන කොටසක්ම ආගමක්ම සමාජ පංතියක්ම නියෝජනය වෙනව. ඒ නිසා කොළඹ නගර සභා ඡන්ද ඉතිහාසයේ ඉතාමත් තියුණු මැතිවරණ ව්‍යාපාරයක් මෙවර තියේවි කියල මම හිතනව.

ප්‍රශ්නය:- මෙවරත් ඔබ පොලිතින් පෝස්ටර් නොමැතිවද ඡන්ද සටන කරන්නෙ?

පිළිතුර: ඒක මගේ දිගු කාලීන ප්‍රතිපත්තියක්. මාධ්‍ය සහයෝගය මම ලබා ගන්නවා. නගරයේ පවිත්‍රතාව ලස්සන අගය කරන කෙනෙක් හැටියට මම පෝස්ටර් හා පොලිතින්වලින් තොර ඡන්ද ප්‍රචාරක ව්‍යාපාරයක් තමයි සැලසුම් කරල තිබෙන්නෙ.

ප්‍රශ්නය:- ඔබේ ඔය අමුතු දේශපාලන සංස්කෘතිය මැතිවරණ ජයග්‍රහණයට ප්‍රමාණවත් මාවතක් කියල හිතනවද?

පිළිතුර:- මම කිසිවක් සැහැල්ලුවෙන් හිතන කෙනෙක් නොවෙයි. ජයග්‍රහණය අභියෝගයක්. හැබැයි මේ තරම් ප්‍රබල අපේක්ෂක ලැයිස්තුවක් ඇතිව සටනට ඇවිල්ල අපි පරදින්නෙ නැහැ.

ප්‍රශ්නය:- මේ දවස්වල එක්සත් ජාතික පක්ෂයේ තිබෙන අර්බුදකාරී තත්ත්වය ඔබට වාසියක් වේවිද?

පිළිතුර:- අනුන්ගේ විපත මගේ සැපතක් කියල මම කියන්නෙ නැහැ. ඉස්සර මම හිටපු තැනට ගරහන කෙනෙක් නොවේ මම. ඒ අයගෙ ඉරණම ඒ අය විසඳා ගනීවි.

ප්‍රශ්නය:- ඔබේ ප්‍රතිවාදී එජාප මහ නගර සභා අපේක්ෂක ඒ. ජේ. එම්. මුසම්මිල් මහතා ගැන යමක් කිව හැකිද?

පිළිතුර:- එතුමා කාලයක් දේශපාලනේ කරල අත්දැකීම් ලබාපු කෙනෙක්. ඒ නිසා කොළඹ දේශපාලනේට අලුත් විනයක් සංස්කෘතියක් ඇති කරන්න පුළුවන් විදියට මේ මැතිවරණ සටන ගෙනියන්න එතුමා සහයවේවි කියල හිතනව. එතුමාගේ අපේක්ෂකත්වයට මම සුභ පතනව.